# 4 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 02

## R 1, W 1 නිපුණතා ආවරණය - 2021

Part 01



- අවබෝධයෙන් ප්‍රතිචාර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය සඳහා ශබ්ද නගා නිවැරදි ව කියවයි.
- ශබ්ද නගා, හැඟීම් ප්‍රකාශ වන පරිදි කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිශ්ශබ්ද ව කියවීමේ හුරුව ලබයි.
- විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් ව එහි භාවිතය ප්‍රදර්ශනය කරයි.
- වචන අතර පරතරය තබමින් නිවැරදි ව වාක්‍ය ලියයි.
- අර්ථය පැහැදිලි වන පරිදි සරල වාක්‍ය ලියයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

For Online Class details WhatsApp 071-9020298

# 4 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $R_1$ $W_1$ ඉගෙනුම් පල

- කියවීමේ කුසලතා ප්‍රදර්ශනය සඳහා ශබ්ද නගා නිවැරදි ව කියවයි.
- ශබ්ද නගා, හැඟීම් ප්‍රකාශ වන පරිදි කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිශ්ශබ්ද ව කියවීමේ හුරුව ලබයි.
- විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් ව එහි භාවිතය ප්‍රදර්ශනය කරයි.
- වචන අතර පරතරය තබමින් නිවැරදි ව වාක්‍ය ලියයි.
- අර්ථය පැහැදිලි වන පරිදි සරල වාක්‍ය ලියයි.

## කියවීමට සහ ලිවීමට හුරු කිරීම

- හතර වන ශ්‍රේණියේ දී අකුරු ලිවීම සඳහා මිලිමීටර් 8 උස ප්‍රමාණයෙන් යුත් තනිරූල් පොතක් භාවිත කළ යුතු ය. හතර වන ශ්‍රේණියේ දී අකුරක ප්‍රමාණය තනි රූලේ **3/4** කි. මේ සඳහා ආදර්ශයක් දක්වා ඇත.

### මධ්‍ය අක්ෂර



### ආරෝහණ අක්ෂර



# අවරෝහණ අක්ෂර











## පිලි සහිත අකුරු යෙදුණු වචන සහිත වාක්‍ය කියවීම සහ ලිවීම

01. ඉරි ඇඳි අකුරු වලට ගැළපෙන ස්වරය හා පිල්ලම ලියන්න

| | | |
|---|---|---|
| 1. | රජත රථ වාහන ගැන රචනාවක් ලියයි.<br>රාජාලියා රාත්‍රියට පියාඹා නොයයි. | ර - අ - පිල්ලමක් නැත.<br>රා - ආ - ඇලපිල්ල. |
| 2. | උඩුමහලේ රැකියා කරන අයට රැකවරණය මිදි.<br>රෑන ගිරවු රෑට කුඩුවලට යති. | ..............................<br>.............................. |
| 3. | රිළවා රිද්මයට නටයි.<br>වහලයට රීප්ප ගෙනා යුතු ය. | ..............................<br>.............................. |
| 4. | රුවන් රුවල හදයි.<br>රූපවාහිනියේ රූප රාමු අපැහැදිලි ය. | ..............................<br>.............................. |
| 5. | රෙදිවල බරට රෙදිවැල කඩා වැටෙයි.<br>රේඛා රේන්දය ගොතයි. | ..............................<br>.............................. |
| 6. | රොහාන් කැලෑ රොදෙහි අතරමං වෙයි.<br>රෝහණ අඹ පැළයක් රෝපණය කරයි. | ..............................<br>.............................. |

## 02. ඉරි ඇඳි අකුරු වලට ගැළපෙන ස්වරය හා පිල්ලම ලියන්න

1. දසුන් ලස්සන දර්ශනයක් චිත්‍රයට අඳියි.
   දාමිණී දානය ගෙන පන්සලට යයි.

   ද - අ - පිල්ලමක් නැත.
   දා - ආ - ඇලපිල්ල.

2. දැහැමි දැහැත් වට්ටිය සාදයි.
   දෑතට දෑකැති දෙකක් ගන්න.

   ..........................................................
   ..........................................................

3. දිනිති දිය ඇල්ල නරඹයි.
   දීපා දීකිරි දීසියට දමයි.

   ..........................................................
   ..........................................................

4. දුර ගමන් යෑම දුෂ්කර ය.
   දූවිලි ඇවිස්සීමෙන් පරිසරය දූෂණය වෙයි.

   ..........................................................
   ..........................................................

5. දරුවන් දෙදෙනාගේ දෙදණ වණ වී ඇත.
   දේශගුණය පිළිබඳ දේශනය සාරවත් ය.

   ..........................................................
   ..........................................................

6. දොළ ළඟ දොඹ ගසක් ඇත.
   දෝණි දෝලාවෙන් බැස්සේ ය.

   ..........................................................
   ..........................................................

## 03. ඉරි ඇඳි අකුරු වලට ගැළපෙන ස්වරය හා පිල්ලම ලියන්න

1. ගෘහ අලංකරණයට කෘත්‍රිම තෘණ වර්ග භාවිත කරයි. ..........................................................
2. ගොයමේ වල් පැළවලට කෘමිනාශක ඉසින විට කුඩා කෘමීන් මරණයට පත් වේ. ..........................................................
3. පෘථිවි පෘෂ්ඨය කොටස් තුනකින් සමන්විත වේ. ..........................................................
4. වෘකයා වෘක්ෂලතා අතරින් නොපෙනී ගියේ ය. ..........................................................
5. පෘතුගීසීන් අප රටට පැමිණියේ පෘතුගාලයේ සිට ය. ..........................................................
6. ගෘහණිය ගෘහභාණ්ඩ පිළිවෙළට තබයි. ..........................................................

## 04. ගැට ඇලපිල්ල සහිත අකුරු යෙදෙන වචන වචන පෙළපොතෙන් හෝ වෙනත් පොත්/පුවත්පත් ආදියෙන් සොයා ලියන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

05. ඉරි ඇඳි අකුරු වලට ගැළපෙන ස්වරය හා පිල්ලම ලියන්න.

1. කෞශල්‍යා කෞතුකාගාරය නැරඹීමට ගියාය. ..................................................
2. කෞතුකාගාරයේ පෞරාණික වස්තු තැන්පත් කර තිබේ. ..................................................
3. නෞකාධිපති මුහුදේ රළ පහර වැඩි නිසා නෞකාව ආපසු හැරවීමට තීරණය කරයි. ..................................................
4. අප සැම පෞද්ගලික සෞඛ්‍යය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. ..................................................
5. කෞමදි ගුරුවරුන්ට ගෞරවයෙන් සලකයි. ..................................................

06. කොම්බුව හා ගයනුකිත්ත සහිත අකුරු යෙදෙන වචන වචන පෙළපොතෙන් හෝ වෙනත් පොත්/පුවත්පත් ආදියෙන් සොයා ලියන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

07. ඉරි ඇඳි අකුරු වලට ගැළපෙන ස්වරය හා පිල්ලම ලියන්න.

1. සමාධි ප්‍රතිමාව ශෛලමය ප්‍රතිමාවකි. ..................................................
2. අපේ වෛද්‍යවරු කාරුණික ව කටයුතු කරති. ..................................................
3. දෛනික ව බෙහෙත් බොන ලෙස වෛද්‍යවරයා උපදෙස් දුන්නේ ය. ..................................................
4. කියවීම් පොතේ වෛවර්ණ පින්තූර ඇතුළත් කර ඇත. ..................................................
5. රුවන්මැලි චෛත්‍යය අනුරාධපුරයේ ඉදිකර ඇත. ..................................................

08. කොම්බු දෙක සහිත අකුරු යෙදෙන වචන වචන පෙළපොතෙන් හෝ වෙනත් පොත්/පුවත්පත් ආදියෙන් සොයා ලියන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

**පිළි සහිත අකුරු යෙදුණු වචන සහිත සරල ඡේද කියවීම හා ලිවීම.**

09. ඡේදය කියවා 'ව' අකුරෙන් පටන් ගන්නා වචන සහ ව අකුරට පිළි යෙදුණු වචන සොයා ලියන්න. ඒවායේ ශබ්ද සහ පිල්ලම නම් කරන්න.

> වනාන්තර එළිපෙහෙළි කර වර්ෂාව එන තෙක් හේන් ගොවියෝ බලා සිටිති. කාලගුණ වාර්තා අනුව හේන් ගොවිතැනට වර්ෂාවෙන් ජලය ලැබෙන්නේ අගෝස්තු සිට ඔක්තෝබර් තෙක් මාසවල දී ය. ගොවියෝ ලී කොට සිටුවා වනසතුන්ගෙන් වගා ආරක්ෂා කර ගැනීමට වැටක් නිර්මාණය කරති. මෙසේ මහන්සි වන ගොවීන්ගේ එක ම වෑයම වන්නේ වනසතුන්ගෙන් බෝගවලට සිදුවිය හැකි විනාශය වළක්වා ගැනීම යි. වීරියය අත් නොහැර රෑ දවල් මහන්සි වන ගොවියෝ තම බෝග වැඩෙන ආකාරය දැක සතුටු වෙති.
>
> ඔවුන් වඩාත් ම සතුටු වන්නේ තම අස්වැන්න හොඳ මිලකට වෙළඳාම් කර ගැනීමට හැකි වූ විට ය. හේන් ගොවිතැන වෘත්තිය කරගත් ඔවුන් බොහෝ විට වේදනා විඳින්නේ වන සතුන්ගෙන් වගා විනාශ වූ විට ය. වනසතුන් ද වටිනා සම්පතකි. වන සතුන්ගෙන් බෝග ආරක්ෂා කිරීමට කටයුතු කරන්නේ නම්, සතුන් කෙරෙහි මිනිසුන්ට ඇති වන වෛරය අවම කර ගත හැකි වේ. එයින් වන සතුන් ද ආරක්ෂා වේ.

වනානත්ර - ව - අ - පිල්ලමක් නැත.
...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................